Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සතිය - 13

විෂය - ගිණුම්කරණය

ශ්‍රේණිය - 12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

# හවුල් ව්‍යාපාර ගිණුම් බඳවා ගැනීම් හා ඉවත් වීම්

A හා B 2:1 අනුපාතයට ලාභ අලාභ බෙදාගනිමින් ගෙන යන හවුල් ව්‍යාපාරයෙන් 2020-12-31 දින B ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත්තේය. එදිනම ලාභයෙන් භාගයක් දීමේ පොරොන්දුව පිට C ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී.

මෙදින කීර්තිනාමය රු 150 000 කට අගය කළ අතර කීර්තිනාම ගිණුමක් පොත්වල නොපවත්වාගෙන යාමට හවුල් කරුවෝ තීරණය කලේය.

හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම පහත දැක්වේ

1 ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත 10% ක පොලි හිමිවීම

2 සෑම හවුල් කරුවකුටම මසකට රු 2500 බැගින් වේතන ගෙවීම.

3 ගැනිලි මත 5% පොලි අයකිරීම

2020-12-31 දි ඊ ට ව්‍යාපාරයෙන් හිමිවිය යුතු කොටස නය ගිණුමකට මාරු කිරීමටත් තීරණය විය

ABC ගේ හවුල් ව්‍යාපාරයේ 2020/12/31 දිනට ව්‍යාපාරයේ පොත්වලින් උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ

| | | |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 500 000 | - |
| මෝටර් රථ පිරිවැය හා ක්ෂය වෙන් කිරීම | 200 000 | 50 000 |
| කාර්යාල උපකරණ පිරිවැය හා ක්ෂය වෙන් කිරීම | 100 000 | 30 000 |
| ගැණුම් හා විකුණුම් | 500 000 | 900 000 |
| ආපසු එවුම් හා ආපසු යැවුම් | 20 000 | 50 000 |
| ගෙනවීමේ කුලි | 10 000 | - |
| ආනයන තීරු ගාස්තු | 20 000 | - |
| 2020/01/01 ට තොගය | 50 000 | - |
| ගැනිලි A | 40 000 | |

| | | | |
|---|---|---|---|
| | B | 30 000 | |
| ප්‍රචාරන වියදම් | | 10 000 | - |
| රක්ෂණ හා වරිපනම් | | 5 000 | - |
| ජංගම ගිණුම් | A | - | 30 000 |
| | B | - | 20 000 |
| විදුලි ගාස්තු | | 3 000 | - |
| දුරකථන ගාස්තු | | 2 000 | - |
| සේවක වැටුප් හා වේතන | | 10 000 | - |
| ණය ගැතියෝ හා ණය හිමියෝ | | 110 000 | 80 000 |
| අඩමාන ණය වෙන් කිරීම 2020/01/01 ට | | - | 7 000 |
| විකුණුම් වියදම් | | 10 000 | - |
| කුලී ආදායම් | | - | 20 000 |
| විවිධ ආදායම් | | - | 10 000 |
| බැංකු | | 200 000 | |
| මුදල් | | 77 000 | - |
| ප්‍රාග්ධනය | A | - | 300 000 |
| | B | | 200 000 |
| C ගෙන ආ මුදල | | | 200 000 |
| | | 1897 000 | 1897 000 |

අතිරේක තොරතුරු ඔබට සපයා ඇත.

1 2020/12/31 දිනට තොගය රු 90 000 කට තක්සේරු කර ඇත.

2 විදුලි ගාස්තු රු 2 000 ක්ද දුරකථන ගාස්තු රු 1 000 ක්ද වර්ෂයට අදාලව ගෙවියයුතුව ඇත.

3 රක්ෂණ ගාස්තු රු 1000 ක් ඉදිරි වර්ෂය සඳහාය

4 ණය ගැතියන්ගෙන් රු 10 000 ක් බොල්ණය ලෙස කපා හැරියයුතු අතර ඉතිරි ණය ගැතියන්ගෙන් 10% ක් අඩමාණ ණය සඳහා වෙන් කිරීම

5 මෝටර් රථ වාර්ෂිකව පිරිවැයට 10% ක්ද කාර්යාල උපකරණ පිරිවැයට වාර්ෂිකව 5% ක්ද ක්ෂය කිරීම

අවශ්‍යවන්නේ

1) 2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා AB හා C ගේ හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය හා විසර්ජන ගිණුම

2) හවුල් කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

3) 2020-12-31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.